**ශීර්ෂය 292- සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 28 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්වාගණනය කළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශනය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කළ සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කර ගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින්, මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප බව ප්‍රකාශ කළ නොහැක. ඒ හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශද මෙම වාර්තාවෙන් ඉදිරිපත් නොකෙරේ.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය අනුව රු.998,657,362 ක් වූ අග්‍රිම ශේෂයට චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව අක් මුදල් ගැලපීම් ගිණුමක් සකස් කර නොතිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | 2018 වසරේ ගිණුම් ප්‍රකාශ පිළියෙල කිරීමේ දී රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 267/2018 චක්‍රලේඛ 7(vi) ඡේදය අනුව අක්මුදල් ගැලපීම් ගිණුමක් පිළියෙල නොකල අතර ඒ සඳහා ප්‍රමාණවත් මාර්ගෝපදේශයක් නොලැබුණි. |

**1.6.2 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයෙහි වෙනත් ලැබීම් තුළ ඇතුළත් මුදලින් ලද රු.11,221,976 ක තැන්පතු ලැබීම් හා රු.2,536,919 ක රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ලැබීම් නැවත වරක් ආදායම් නොවන ලැබීම් ලෙසද දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කිරිමට කටයුතු කළ යුතු වීම. | 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය නොවන වෙනත් ලැබීම් රු.57,855,975 ක් බව කාරුණිකව දන්වා සිටිමි |

| | | | |
|---|---|---|---|
| (ආ) | ආදායම් නොවන ලැබීම් රු.76,100,474 ක් වු වටිනාකමින් රු.1,452,504 ක් වු ආපසු ගෙවීම අඩු නොකර මූල්‍ය ප්‍රකාශනවල ආදායම් නොවන ලැබීම් ගිණුම්ගත කර තිබුණි. | ආදායමින් ආපසු ගෙවීම ගිණුම්ගත බව කළ යුතු විම. | ඉදිරියේදී නිවැරදිව පිළියෙල කරන |

## 1.6.3 දේපල පිරියත හා උපකරණ

------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ---------------------- | ----------- | ------------------------------- |
| (අ) | මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් ශේෂය රු.890,897,334 ක් වුවද, 2018 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය රු.2,151,650,841 ක් ලෙස දක්වා තිබූ බැවින් රු.1,260,753,507 ක වෙනසක් නිරීක්ෂණය විය. තවද භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව මූල්‍ය නොවන වත්කම ආරම්භක ශේෂය රු.2,149,691,465 ක් වූ අතර, මූල්‍ය ප්‍රකාශන අනුව මූල්‍ය නොවන වත්කම් ශේෂය රු.2,151,650,841 ක් වූයෙන් රු.1,959,376ක වෙනසක් නිරීක්ෂණය විය. | නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවල අගයන් දැක්විය යුතු විම. | 2018 වර්ෂය තුළදී යාවත්කාලීන කර ඇත. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුල මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයේ මිලදී ගැනිම්වල එකතුව රු.21,964,322 ක් වුවද මාසික ගිණුම් ප්‍රකාශනය අනුව එම ශේෂය රු.26,905,179 ක් වූයෙන් වෙනස රු.4,940,857 ක් විය. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතු විම | නැවත මුල සිට ස්ථාවර වත්කම් යාවත්කාලීන කරමින් සිටින බව කාරුණිකව දන්වා සිටිමි . |
| (ඇ) | 2018 දෙසැම්බර් 31 දිනට ජංගම නොවන වත්කම් වශයෙන් රු.2,173,615,163 ක වටිනාකමක් මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයේ දක්වා තිබුණද, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ විසින් නිකුත් කරන ලද වත්කම් වාර්තාව අනුව එම වටිනාකම ශුන්‍ය අගයක් ගෙන තිබුණි. | වත්කම් වාර්තා යාවත්කාලීන කළ යුතු විම. | 2019 වසරේ සිට ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කරනු ලබන බව. |

**1.6.4 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2003 වර්ෂයේ සිට පැවත එන මිය ගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.62,668 ක දේපල ණය මුදල නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම. | උරුමකරුවන් පිළිබඳ තොරතුරු නොලැබීම නිසා මෙම ශේෂය නිරවුල් කිරීමට නොහැකි වී ඇති බව කාරුණිකව දන්වා සිටිමි. |
| (ආ) | දෙපාර්තමේන්තු පොත් සහ භාණ්ඩාගාර මුද්‍රිත සටහන අතර 2015 වර්ෂයේ සිට පැවත එන රු.100,125 ක වෙනස හඳුනාගෙන නිවැරදි කිරිමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 427(අ) අනුව වෙනස හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වීම. | නිරවුල් කිරීමට ප්‍රමාණවත් තොරතුරු නොමැත ඉදිරියේදී නිවැරදි කරනු ලැබේ. |

**1.6.5 විගණනය සඳහා සාක්ෂි නොවීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශනයේ 2018 දෙසැම්බර් 31 දිනට රු.2,173,615,163 ක ස්ථාවර වත්කම් පෙන්නුම් කළද ස්ථාවර වත්කම් වාර්තාවක් විගණනයට ඉදිරිපත් නොකරන ලදී. | ස්ථාවර වත්කම් වාර්තාවක් පවත්වා ගත යුතු වීම. | පරිගණක මෘදුකාංගය මඟින් ලබාගන්නා වාර්තාද 0 වී ඇති බැවින් දැනට සකස් කරමින් පවතී. |
| (ආ) | දෙපාර්තමේන්තුවේ තනතුරු 12 කට අදාළව නිලධාරීන් 204 දෙනෙකුගෙන් අයකර ගත යුතු රු.1,448,000 ක ඇප මුදල් අය කිරීම් පිළිබඳ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | ඇප තැන්පත් ලේඛනය යාවත්කාලීනව පවත්වා ගත යුතු වීම. | ඇප තැන්පත් ලේඛනය යාවත්කාලීන කිරීමට සටහන් කර ඇත. |

**1.6.6 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) රාජකාරී දුරකථන ලේඛනය | | |
| රාජකාරී දුරකථන ලේඛනයක් පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 845(1) ප්‍රකාර 26 වැනි පරිශිෂ්ඨයේ පරිදි රාජකාරී දුරකථන ලේඛනයක් පවත්වා ගත යුතු වීම. | පවත්වාගෙන යාමට සටහන් කර ගතිමි. |
| (ආ) ඇප ලේඛනය | | |
| ඇප තැබිය යුතු නිලධාරින් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් යාවත්කාලීනව පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 891(1) හි සඳහන් තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පවත්වා ගත යුතු වීම. | ඇප ලේඛනය අඩුපාඩු නිවැරදි කර යාවත්කාලින කිරීමට කටයුතු කරමි. |
| (ඇ) බැරකම් පිළිබඳ ලේඛනය | | |
| බැරකම් පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් නිතිපතා පරීක්ෂා කළ හැකි වන පරිදි බැරකම් ලේඛනයක එම බැරකම් සටහන් කළ යුතු වීම. | විගණනයෙන් පෙන්වා දීමෙන් පසුව බැරකම් ලේඛනයක් පවත්වාගෙන යාමට කටයුතු කර ඇත. |
| (ඈ) වාහන ලොග් පොත | | |
| වාහන ලොග් පොත් යාවත්කාලීනව පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 1645(අ) හි දැක්වෙන විධිවිධාන ප්‍රකාරව පොදු 267 අකෘතිය ප්‍රකාරව වාහන ලොග් පොත් සෑම වාහනයක් සම්බන්ධයෙන්ම පවත්වා ගත යුතු වීම. | එම අදාළ ලොග් පොත් ඒකක භාර මාණ්ඩලික නිලධාරින් භාරයේ පවතින අතර අඩුපාඩු පවතින ලොග් පොත් යාවත්කාලින කිරීමට නිළධාරින් දැනුවත් කළෙමි. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | වාහන ලැයිස්තු ගතකිරීමේ ලේඛනය<br>-------------------------------------<br>දෙපාර්තමේන්තුව සතුව වාහන 138 ක් පැවතුණද වාහනය තමන්ට භාරදුන් දිනය හා පැවරු දිනය වැනි තොරතුරු ඇතුළත් වාහන ලැයිස්තු ගත කිරීමේ ලේඛනයක් පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 1647(ඉ) ප්‍රකාරව වාහන ලැයිස්තු ගත කිරීමේ ලේඛනයක් පවත්වා ගත යුතු විම. | මුදල් රෙගුලාසි අනුව සකස් කර නැත. |

## 1.6.7 ගණන්දීමේ නිලධාරි විසින් සිදුකළ යුතු සහතික වීම්

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| දෙපාර්තමේන්තුව මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කළ සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණද, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | සමාලෝචනයන් සිදුකර වාර්තා ඉදිරිපත් කළ යුතු විම. | ඉදිරියේදී ඉදිරිපත් කිරිමට කටයුතු කරනු ලැබේ. |

**1.6.8 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් පහත දැක්වේ.

| නීති,රීති,රෙගුලාසිවලට යොමුව | | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිළධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | | |
| (i) | XIX පරිච්ඡේදයේ 5.6 වගන්තිය | 2017 වර්ෂය තුලදී තක්සේරු කාලය අවසන් වී තිබුණු රජයේ නිවාස 19 කින් එම ආර්ථික කුලියම සමාලෝචිත වර්ෂය තුලදීද අයකර තිබුණි. | රජයේ නිවාස තක්සේරු කිරීමට ක්‍රියාකළ යුතු විම. | තක්සේරු වාර්තා ගෙන්වා අවශා ක්‍රියාමාර්ග ගන්නා බව. |
| (ii) | XIX පරිච්ඡේදයේ 5.7. වගන්තිය | නිලධාරීන් පස්දෙනෙකුගෙන් 2016 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා නිවාස කුලී රු.218,139 ක් අඩුවෙන් අයකර ගෙන තිබුණි. | නිවාස කුලී නියමිත කුලිය නියමිත රේටයන්ට අනුව අයකරගත යුතු වීම. | නිල නිවාස කුලී අයකිරීමේදී සිදුවූ පාඩුව අයකර ගැනීමට කටයුතු කරන බව. |
| (iii) | XIX පරිච්ඡේදයෙහි 06.1 හා 6.15 උප වගන්තිය | රජයේ නිවාස 26 ක බදු කාලය ඉක්මවා තිබුණද එම නිවාසවල නිලධාරීන් පදිංචිවී සිටින බව නිරීක්ෂණය විය. | ගිවිසුම් ප්‍රකාරව වර්ෂ 05 ක කාලසීමාවට පමණක් බදු ලබා දීමට කටයුතු කළ යුතු වීම. | පිළිතුරු ලැබී නැත. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | මුදල් රෙගුලාසි 454(1) | 2015 දෙසැම්බර් මාසයේදි රු.1,680,750 ක මුදලකට මිලදිගෙන සවිකරන ලද CCTV කැමරා පද්ධතියට සවි කර වසර 03 ක පමණ කාලයක් ගත වී තිබුණද කිසිදු ලේඛනයක සටහන් කර නොතිබුණි. | ආණ්ඩුවේ සෑම ද්‍රව්‍යයක්ම බාර ගැනීම හා නිකුත් කිරීම බඩු ලේඛන පොතෙහි සඳහන් කළ යුතුය | සවිකිරීම් ලේඛනයට ඇතුලත් කිරීමට කටයුතු කර ඇත |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිළධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) පුනරාවර්තන වැය විෂයයන් 21 ක රු.14,443,469 ක ප්‍රතිපාදන හෝ මූලධන වැය විෂයයන් 28 ක රු.629,630,828 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව ඇස්තමේන්තුව තාත්විකව සකස් කළ යුතු වීම. | අනපේක්ෂිත කරුණු, අක් මුදල් නොලැබීම, වවුචර් ඉදිරිපත් නොවීම මත ප්‍රතිපාදන ඉතිරි විය. |
| (ආ) වැය විෂයයට රු.3,000,000 මාරුකිරීමෙන් පසු ඉතිරිය රු.4,535,643 ක් හෙවත් සියයට 62 ක් පමණ විය. ඒ අනුව නිසි සැලසුමකින් හා අවශ්‍යතාවයන් හඳුනාගැනීමකින් තොරව මුදල් මාරුකර තිබුණි. | කටයුතු පූර්ව සැලැසුමක් අනුව සිදු කළ යුතු වීම. | නොවැළැක්විය හැකි හේතු මත ඉතිරිය සිදු වී ඇත. |
| (ඇ) ලෝක සත්ත්ව සෞඛ්‍ය සංවිධානයට සාමාජික ගාස්තුවෙන් කොටසක් වශයෙන් ගෙවූ රු.1,983,519 මුදල විධිමත් අනුමැතියකින් තොරව මූලධන වැය විෂයකින් ගෙවා තිබුණි. | විධිමත් අනුමැතියක් ලබාගෙන ගෙවීම් කළ යුතු වීම | ලෝක සත්ත්ව සෞඛ්‍ය සංවිධානයේ සාමාජිකත්වය වෙනුවෙන් අදාල වැය විෂයයෙහි ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම මත ගෙවීම් කර ඇත. |

### 2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ඉංජිනේරු අංශයට ලැබී තිබුණු සහතික නොකළ බිල්පත් වටිනාකම රු.18,362,056 ක් බැරකම් ලෙස දක්වා නොතිබුණි. | චක්‍රලේඛය අනුව බැඳීම් ගිණුම්ගත කිරිමට ක්‍රියාකළ යුතු විම. | ප්‍රමාදයක් සිදු වී ඇති බව පිළිගනිමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මූලධන වැය විෂයයන් 03 කට අදාළව ප්‍රතිපාදන ඉක්මවා රු.1,333,437 ක් වටිනා බැරකම් ඇතිකරගෙන තිබුණි. | මුදල් රෙගුලාසි 94(2) අනුව ක්‍රියාකළ යුතු වීම. | පිළිගනිමි. |
| (ඇ) | මූලධන වැය විෂයයන් 02 ක් සඳහා බැරකම් දක්වා නොමැතිව, 2018 වර්ෂයේ වියදම රු.1,475,450 ක් 2019 වර්ෂයේදී ගෙවා තිබුණි. | බැරකම් නිවැරදිව ගිණුම්ගත කළ යුතු වීම. | පිළිගනිමි. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයට අදාළව ගෙවිය යුතු එකතු කළ අගය මත බද්ද රු.1,980,679 ක් වුවද, එම මුදල බැරකම් ලෙස නොදක්වා 2019 වර්ෂයේ ප්‍රතිපාදනවලින් ගෙවා තිබුණි. | බැරකම් නිවැරදිව ගිණුම්ගත කළයුතු අතර ප්‍රතිපාදන සලසාගෙන ගෙවීම් කළ යුතු වීම. | එකතුකල අගය මත ගෙවන ලද මුදලක් වන අතර තහවුරු කිරීමෙන් පසුව ගෙවීමට කටයුතු කර ඇත. |

## 2.3 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වෙනත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු වෙතින් ලැබුණු ප්‍රතිපාදන එකතුව රු.75,648,147 ක් උපයෝජනය නොකර ආපසු යවා තිබුණි. | ප්‍රතිපාදන උපරිම ලෙස උපයෝජනය කළ යුතු වීම. | පිළිතුරු ලැබී නැත |

## 2.4 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | අවස්ථා 7 කදී ලබාදුන් රු.95,547 ක අත්තිකාරම් මුදල උපයෝජනය නොකර මුළු මුදලම නැවත පියවා තිබුණි. | අවශ්‍යතාවය අනුව අත්තිකාරම් ලබාගත යුතු වීම. | මින් ඉදිරියට අදාළ අධ්‍යක්ෂවරු දැනුවත් කිරිමට කටයුතු කර ඇත. |
| (ආ) | අවස්ථා 66 කදී ලබාදුන් රු.4,992,011ක අත්තිකාරම් මුදලින් රු.1,324,007 ක මුදලක් ඉතිරි වී තිබුණි. | නිවැරදි අත්තිකාරම් ලබාදීමට කටයුතු කළ යුතු විම. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | තත්කාර්ය අතුරු අග්‍රිමයක් ලබාදිය හැකි රු.100,000 ක සීමාව ඉක්මවා අවස්ථා 124 කදී නිලධාරීන් 29 ක් වෙත රු.93,599,988 ක අත්තිකාරම් ලබාදී තිබුණි. | 2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මගින් සංශෝධිත මුදල් රෙගුලාසි 371(2)(ආ) ප්‍රකාරව කටයුතු කළ යුතු විම. | ඉදිරියේදී තත්ත්වය පාලනය කිරිමට කටයුතු කරමි. |

## 2.5 තැන්පතු ශේෂයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වර්ෂ 02 ඉක්මවූ රු.1,498,731ක් වටිනා තැන්පත් ශේෂ 60 ක් රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 571 අනුව කටයුතු කළ යුතු වීම. | එම ශේෂයන් හඳුනා ගෙන නිරවුල් කිරීමට කටයුතු කරන බව. |
| (ආ) | කොන්ත්‍රාත් නඩත්තු කාලය ඉක්ම වූ රු.2,453,292 ක් වටිනා රැඳවුම් මුදල් ශේෂ 63ක් සම්බන්ධයෙන් පසු විපරම් කර ගෙවීමට කටයුතු නොකර තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. | රැඳවුම් මුදල් සම්බන්ධයෙන් නිවැරදි කිරීම් සිදු කළ යුතු වීම. | අදාල ශේෂයන් හඳුනා ගෙන රජයේ ආදායමට බැර කිරීමට හෝ අදාල ආයතන වෙත ගෙවීමට කටයුතු කරන බව. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 සැලැසුම් කිරීම

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වාර්ෂික අයවැය පදනම් කරගෙන ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර තිබුණද එම ප්‍රතිපාදනවලින් පෙර වර්ෂයේ රු.51,772,120 ක බැරකම් නිරවුල් කර තිබුණි. | අදාළ වර්ෂයේ වියදම් පමණක් වාර්ෂික අයවැය සැලැස්මෙන් ගෙවිය යුතු විම | සැලැස්මේ ප්‍රතිපාදන උපයෝගී කරගෙන ගෙවීම් කර ඇත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | අයවැය ඇස්තෙමේන්තුව අනුව මූලධන ප්‍රතිපාදනය රු.1,165,000,000 ක් වුවද වියදම රු.730,921,347 ක් වූ බැවින් සමස්ථ මූලධන ක්‍රියාකාරකම්වලින් සියයට 37 ක ප්‍රමාණයක් ඉටු කර නොතිබුණි. | අයවැය ප්‍රතිපාදන උපරිම ලෙස උපයෝජනය කිරීමට කටයුතු කල යුතු විම. | ප්‍රමාණවත් අක්මුදල් නොලැබීම මත ගෙවීම් කර නැත |

## 3.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මී ගවයින් 7000 කගේ කාර්යසාධනය පරීක්ෂාව, ජානමය හා ආහාර ලබාදීම කළමනාකරණය වැඩිදියුණු කිරීම, හෙක්ටයාර් 02 ක බීජ සංවර්ධනය කිරීම සහ කුකුළු හා ඒ ආශ්‍රිත නිෂ්පාදන වැඩිදියුණු කිරීම යන ව්‍යාපෘති 04 ක් සඳහා රු.9,890,000 කට ප්‍රතිපාදන සළසා තිබුණද 2018 දෙසැම්බර් 31 දින වන විටත් කිසිදු කාර්යයක් ඉටු කිරීමට කටයුතු කර නොතිබුණි. | සැලැසුම් කළ ක්‍රියාකාරකම් ඉටුකළ යුතු විම. | අඛණ්ඩව සිදුවන ව්‍යාපෘතියක් වන බව දක්වන අතර, සේනා දළඹු වසංගත තත්ත්වය නිසා බීජ ලබාගැනීමට නොහැකි බව දක්වා ඇත. |

## 3.3 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඉදිකිරීම් කොන්ත්‍රාත් 03 ක වටිනාකම රු.165,831,215 කට අදාළව ඇස්තමේන්තු සකස් කිරීම ව්‍යුහගත සැලසුම් හා විස්තරාත්මක සැලසුම් සකස් කිරීමට ජාතික ඉංජිනේරු පර්යේෂණ මධ්‍යස්ථානය වෙත රු.1,602,094 ක් 2018 වර්ෂයේදී ගෙවීම් කර තිබුණද , 2019 මැයි මාසය වන විටත් ඉදිකිරීම් කටයුතු ආරම්භකර නොතිබුණි. | අයවැය මඟින් ප්‍රතිපාදන වෙන් කිරීම් ප්‍රයෝජනයට ගත යුතු විම. | පිළිගනිමි. |

**3.4** **ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම**

පහත සදහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මධ්‍යම කුකුල් පර්යේෂණ මධ්‍යස්ථානයේ පැවැති තාරා කොටුව 2015 වර්ෂයේදී රු.1,562,325 ක් වියදමක් දරා ගවගාලක් බවට පරිවර්තනය කර තිබුණද ගවගාල කිසිදු ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යයව තිබුණි. | වැය කරන ලද මුදලට ආර්ථික භාවයක් ලබාගැනීම පිණිස ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතු විම. | ගවගාල නිෂ්කාර්යය තත්ත්වයේ පවතින නමුත් ඉදිරියේදී මෙය ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි |

**3.5** **ප්‍රසම්පාදනයන්**

පහත සදහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) ඉංජිනේරුවරයාගේ ඇස්තමේන්තුවේ සදහන් මිල ගණන් හා කොන්ත්‍රාත්කරුගේ මිල ගණන් අතර කොන්ත්‍රාත්තු 03 කට අදාළව රු.5,200,509 ක අසාමාන්‍ය වෙනසක් නිරුපණය විම හේතුවෙන්, අඩු වටිනාකමකින් යුතු කාර්යසාධන සුරක්ෂණයක් ලබා ගැනීමට කටයුතු කර තිබුණි. එම හේතුව නිසා කොන්ත්‍රාත්වල අනාගත අවිනිෂ්චිතතා සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවට ගත හැකි ක්‍රියාමාර්ග සීමා වී තිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.9.11(ඇ) සහ (ඈ) මාර්ගෝපදේශය අනුව කටයුතු කළ යුතු විම. | මිළ විශ්ලේෂණයක් කොන්ත්‍රාත්කරුගෙන් ලබාගැනීමටත්, කාර්යය සාධන සුරක්ෂණය සියයට 10 ක් ලබාගැනීමට කටයුතු කර ඇත. |
| (ආ) ප්‍රතිපාදිත මුදල රු.45,429,714 ක් වූ ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් 15 ක් සඳහා රු.27,957,374 ක් ප්‍රතිපාදන ඉක්මවමින් ගෙවීම් කර තිබුණි. | මුළු පිරිවැය ඇස්තමේන්තු නිවැරදිව හා තාත්විකව සකස් කළ යුතු විම. | මින් ඉදිරි වර්ෂවල දී මෙම තත්ත්වය අවම කිරීමට වග බලා ගනිමි. |

**3.6 වත්කම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) පොළොන්නරුව කෘතිම සිංචන මධ්‍යස්ථානයේ වර්ග අඩි 6746 ක් වූ රජයේ නිවාස 06 ක්, සයිලේජ් සැකසුම් ගොඩනැගිලි 01ක්, ජෙනරේටර් 01 සහ කැටපිලර් ජෙනරේටර් 01 ක් වර්ෂ 06 ක සිට වර්ෂ 19 ක් දක්වා කාලයක් නිෂ්ක්‍රියව පැවතුණි. | සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතු විම. | රජයේ නිවාස අළුත්වැඩියා කිරීමට කටයුතු කර ඇති අතර, භාණ්ඩ සමීක්ෂණ කටයුතු සඳහා ඇතුළත් කර ඇත. |
| (ආ) පශු විමර්ශන මධ්‍යස්ථානයේ කිරි තාක්ෂණ රසායනාගාරයට 2017 දෙසැම්බර් මාසයේදි විදුලි ජනක යන්ත්‍රයක් මිලදී ගැනීම වෙනුවෙන් රු.4,484,698 ක් හා යන්ත්‍රය ස්ථාපිත කිරිම සඳහා රු.725,928 ක ගොඩනැගිලි වියදම ද ඇතුළත්ව එකතුව රු.5,210,626 ක් ගෙවා තිබුණද 2019 මැයි මස වන විටත් යන්ත්‍රය ස්ථාපනය කර නොතිබුණි. | වත්කම් පූර්ණ කාලීනව උපයෝජනය කළ යුතු විම. | 2019 පෙබරවාරි 28 දිනට පෙර ස්ථාපනය කරන බව හා ඊට පසු ගොඩනැගිල්ල ප්‍රයෝජනයට ගත හැකි බව දන්වා ඇත. |

**3.7 පාඩු හා හානි**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) අයකර ගැනීමට හෝ අත්හැරිමට ඇති පාඩු වශයෙන් වර්ෂ 10 ට වැඩි රු.1,030,300 ක් වූ සිද්ධි 16 ක්, වර්ෂ 05 ක සිට වර්ෂ 10 ක් අතර රු.119,882ක් වූ සිද්ධි 02 ක් හා වර්ෂ 05 ට අඩු රු.3,010,798 ක් වූ සිද්ධි 29 ක් සම්බන්ධයෙන් 2019 පෙබරවාරි 29 වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසිවල සඳහන් පරිදි අවසන් කර නිරවුල් කිරීමට කටයුතු කළ යුතු විම. | පිළිතුරු ලබාදී නැත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | කෘතිම සිංචන මධ්‍යස්ථානයේ විදුලිබිල වෙනුවෙන් 2009 අගෝස්තු සිට 2018 අගෝස්තු දක්වා රු.89,736 ක අධිභාරයක් ගෙවා තිබුණි. | අධිභාර නොගෙවීමට අවශ්‍ය කටයුතු සැලසුම් කළ යුතු වීම. | තැපැල් ප්‍රමාදවීම්, පොත්පත්වල සටහන් කිරීම හා අනුමත කර ගැනීම්, චෙක්පත් අත්සන් කිරීම යන අවස්ථා සඳහා යම් කාලයක් ගත වන බැවින් ප්‍රමාද වී ඇත. |
| (ඇ) | දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 12 දෙනෙකු විදේශීය අධ්‍යයන නිවාඩු ලබාගෙන ඇප බැඳුම්කරයකට එළඹ තිබුණත් අනිවාර්ය සේවා කාලය සම්පූර්ණ නොකිරීම මත අයකර ගත යුතු රු.31,245,665 ක ඇප බැඳුම්කර වටිනාකම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 104 හා 110 අනුව පරීක්ෂණ පවත්වා අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | මුදල් අයකර ගැනීම සඳහා කටයුතු අරඹා ඇත. |

**3.8 කළමනාකරණ දුර්වලතා**

**---------------------------**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| රජයේ නිවාස සඳහා විදුලි මීටර් සවිකිරීමට කටයුතු නොකර එක් රජයේ නිවාසයකින් මසකට රු.100 බැගින් විදුලි බිල පියවීමට කටයුතු කර තිබුණි. එසේ වුවද 2014 වර්ෂයේ සිට 2018 වර්ෂයේ අගෝස්තු තෙක් සමස්ථ විදුලි බිල්පත් වෙනුවෙන් රු.3,603,910 ක මුදලක් ගෙවා තිබුණද, රජයේ නිවාසවලින් ලද දායකත්වය රු30,736 ක් විය. | එක් එක් රජයේ නිවාස සඳහා විදුලි මීටර් සවි කිරීමට කටයුතු කළ යුතු වීම. | පිළිගෙන ඇත. |

**4. තිරසාර සංවර්ධනය**

**4.1 තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දෙපාර්තමේන්තුව විසින් තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" පිළිබඳව දැනුවත් වී නොතිබීම හේතුවෙන් එහි කාර්යයන්ට සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟාවිය යුතු සංධිස්ථානයන්ද ඉලක්ක මත ළඟාවීම මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි. | තිරසාර සංවර්ධන අරමුණු අනුව ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමට කටයුතු කළ යුතු විම. | රේඛීය අමාත්‍යාංශය විසින් එම අමාත්‍යාංශයේ විෂයපථය යටතට ගැනෙන දෙපාර්තමේන්තුව සහ NLDB, Milco ආදී ආයතන සියල්ලම සඳහා තිරසර සංවර්ධන අරමුණු ,ඉලක්ක හා ළඟාවිය යුතු සංධිස්ථානයන් පිළිබඳ දර්ශකයන් හඳුනාගෙන ඇත. |

**5 මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 58 ක්ද, තෘතීය මට්ටමේ තනතුරු 05 ක්ද, ද්විතියන මට්ටමේ තනතුරු 29 ක්ද, ප්‍රාථමික මට්ටමේ තනතුරු 40 ක්ද වශයෙන් තනතුරු 82 ක පුරප්පාඩු පැවතුණි. | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු විම. | පිළිතුරු ලැබී නැත |